// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2112/44 - 2019 මාර්තු මස 01 වැනි සිකුරාදා - 2019.03.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීම (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

*ප්‍රා.ලේ. යොමු අංකය*: 9/3/5/7.

*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2013/WS/461.

විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ ජල ටැංකිය ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය*:

මධ්‍යම පළාතේ මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අස්ගිරි පල්ලේසිය පත්තුව සුළු කොට්ඨාසයේ උතුරු මාතලේ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පුංචිලෙවකන්දවත්ත ගමේ සර්වේ ජනරාල්ගේ මූලික පිඹුරු අංක මා 1716 හි සඳහන් ලෙවකන්දවත්ත නැමති ඉඩමේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1012 ක් වූ බිම් කොටස.

කැබලි අංක 01

ඉඩමේ නම: ලෙවකන්දවත්ත; විස්තරය: විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතියේ මහලෙවකන්ද ජල ටැංකිය ඉදිකිරීම සඳහා; හිමිකම් කියන අය: හපුකොටුවේ ගෙදර ගිබ්සන් හපුකොටුව; බිම් ප්‍රමාණය: හෙක්ටයාර් 0.1012.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.04.03 වැනි දින පෙ.ව. 10.30 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.03.21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශ්‍යතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. ආර්. කේ. හෙන්නායක,
ප්‍රාදේශීය ලේකම්,
යටවත්ත.

2019 පෙබරවාරි මස 26 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, යටවත්ත.

03 - 863

1A - G 29559 - 17 (2019/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.